# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

**මානවශාස්ත්‍ර පීඨය**

## නාට්‍ය හා රංගකලාව

**ශ්‍රී ලංකාවේ යාතු කර්ම සහ ගැමි නාට්‍ය - DMAT 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අ) ඔබ උගත් නිර්වචන පහක් (05) ඇසුරු කොටගෙන 'යාතුකර්ම' (Rituals) යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) ශ්‍රී ලංකාවේ පැවැත්වෙන යාතුකර්ම පහක් (05) නම් කොට ඒවා පැවැත්වීමේ අරමුණු වෙන් වෙන් වශයෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10)

02. අ) කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මයේ අන්තර්ගත වන ප්‍රධාන 'නාට්‍යමය පෙළපාළි' (අන්තර් රංග අවස්ථා) පහක් (05) නම් කරන්න. (ලකුණු 05)

ආ) ඉහත නම් කළ පෙළපාළි අතුරින් ඕනෑම තුනක් (03) තෝරාගෙන, ඒවායේ දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ නිදර්ශන සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

03. "ශාන්තිකර්ම තුළ දක්නට ලැබෙන්නේ නිෂ්ක්‍රීය ප්‍රේක්ෂකයෙකු නොව, සක්‍රීය සහභාගිත්ව ප්‍රේක්ෂකයෙකි." මෙම ප්‍රකාශය නිදසුන් සහිතව සනාථ කරන්න. (ලකුණු 20)

04. "ලක්දිව බුදුසමය ව්‍යාප්ත වීමේදී සාමාන්‍ය ජනතාව ආකර්ෂණය කරගැනීමට සහ දහම් පණිවුඩ සන්නිවේදනය කිරීමට ඇතැම් බෞද්ධ වත්පිළිවෙත්වලට නාට්‍යමය ලක්ෂණ ඇතුළත් කෙරිණ." බෞද්ධ වත්පිළිවෙත් පහක් (05) උදාහරණ වශයෙන් ගෙන මෙම ප්‍රකාශය විවරණය කරන්න. (ලකුණු 20)

05. අ) සොකරි නාටකයේ නිරූපණය කෙරෙන ප්‍රධාන පාත්‍රයන් දෙදෙනෙකුගේ චරිත ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) නිදසුන් දක්වමින් සොකරි නාටකයේ රංග ශෛලිය විස්තර කරන්න. (ලකුණු 10)

06. "කෝලම් නාටකය තත් සමාජයීය ප්‍රජාව වෙත සදුපදේශ සැපයූ ප්‍රබල කලා මාධ්‍යයකි." කෝලම් නාටකයේ අපර රංගයෙන් නිදසුන් දෙකක්වත් සපයාගෙන මෙම අදහස විමසුමට ලක් කරන්න. (ලකුණු 20)

07. අනෙකුත් ගැමිනාටක හා සසඳන විට සාම්ප්‍රදායික නාඩගම් රංගයෙහි දැකගත හැකි සුවිශේෂතා නිදසුන් සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ) සොකරි කතා පුවත
ආ) කෝලම් නාටකයේ පූර්ව රංගය
ඇ) කෝලම් රංග භූමිය
ඉ) නාඩගමෙහි පරිහානිය (ලකුණු 10x2=20)

***********************************